සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

| 71 | S | II |
|---|---|---|

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු**

கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்

**General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019**

**13 ශ්‍රේණිය**
**Grade 13**

**සිංහල - II**
**Sinhala- II**

**පැය තුනයි**
**Three hours**

**සැලකිය යුතුයි :**

- **I** කොටසේ 1 ප්‍රශ්නය ද, **II** කොටසේ **2, 3** ප්‍රශ්න ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- **I** ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මෙම **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- **I** කොටස, **II** කොටසේ පිළිතුරුපත් සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

(01) එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1 ඕෂ්ඨජ අක්ෂර පමණක් ඇතුළත් වරණය තෝරන්න.

1. ග, ජ, ඩ, ද, බ
2. ප, ඵ, බ, භ, ම
3. ස, ඣ, ඵ, ධ, භ
4. ක, ච, ට, ත, ප
5. ඞ, ඤ, ණ, න, ම

(.................)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

1. නිත්‍යනුකූල, ගණ්ඨි පද, නිපුණතාව, සාමාර්ථ්‍යය
2. නිත්‍යනුකූල, ගණ්ඨි පද, නිපුනතාව, සාමර්ථ්‍යය
3. නිත්‍යනුකූල, ගණ්ටි පද, නිපුණතාව, සාමර්ථ්‍යය
4. නිත්‍යානුකූල, ගණ්ඨි පද, නිපුණතාව, සාමර්ථ්‍යය
5. නීත්‍යනුකූල, ගණ්ඨි පද, නිපුණතාව, සාමර්ථ්‍යය (.................)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

1. හබරණ, වැල්ලවාය, පදියතලාව, මාවරමණ්ඩිය
2. අනුරාධපුරය, සීගිරිය, පොළොන්නරුව, නෙළුව
3. කුරුණෑගල, තණමල්විල, නිකවැරටිය, මහනුවර
4. ආගරපතන, දඹදෙණිය, කඹුරුපිටිය, දික්වැල්ල
5. බිබිල, දෙවිනුවර, වීරවිල, මොනරාගල (.................)

1.4 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **නිරවද්‍ය ප්‍රකාශය** තෝරන්න.

1. 'රූ' අක්ෂරයෙහි පිල්ලම වනුයේ ඇදය හෙවත් ඇදපිල්ලයි.
2. 'ෂ' යනු තාලුජ අක්ෂරයකි.
3. 'ඓ' අක්ෂරය දැක්වෙන සංකේතය වනුයේ ගැටය සහිත ඇලපිල්ලයි.
4. ගාත්‍රාක්ෂරයකට 'ය්' එක්වීමේ දී දැක්වෙන සංකේතය වනුයේ යංශයයි.
5. 'ර' යන්න මූර්ධජ අක්ෂරයක් නොවේ. (.................)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යෙදී ඇති වරණය තෝරන්න.

1. සාහිත උළෙල, නිරවද්‍ය වාක්‍ය, රුවන් සිරි, ලංකා ධරණි
2. මධ්‍ය විදුහල, මුසු කිරිය, පාසල් ඇදුරු නීල නයන
3. පහන් එළිය, විද්‍යුත් එළිය, ඔසු උයන, භාෂා ඥානය
4. චන්ද්‍ර මණ්ඩලය, සාහිත්‍ය පොත්, සොඳුරු දසුන්, අහර කිස
5. කෝකිල නාදය, පෙම් හද, දාන හල, චන්දන රුක (.................)

1.6 තත්සම වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

1. සමය, ගුණ, ගජ, වහර
2. තිමිර, නර, පළමු, ගුහා
3. පෙළහර, ත්‍රිපිටකය, මේඝය, සශ්‍රීක
4. කතු, අමෘතය, ආඥාව, ප්‍රවෘත්ති
5. අක්ෂි, හස්ති, වර්ෂා, වාපි (.................)

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

1. විද්‍යා, ආචාර්ය, පද්‍ය, පටිපාටිය
2. වදන්, වෙද, පිළිරැව්, පොළොව
3. ප්‍රතිපත්ති, චක්‍ර, වන්දන, විචිත්‍ර
4. දර්ශන, විශාල, සාගර, ප්‍රසිද්ධ
5. ස්වේද, කෝටි, පිළිබඳ, චිත්ත (.................)

1.8 කර්තෘ, කරණ, සම්ප්‍රදාන හා අවධි යන විභක්තිවලට අයත් සමාස පද පිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.

1. බුදුබණ, කිරිබත්, දරුසෙනෙහස, මුහුදු සුළං
2. අත්අකුරු, ගිනිබිය බුදුපුද, පරපුටු
3. සොරබිය, ගුරුපඬුරු, මල්දම්, බඹදත්
4. බෙහෙත් බඩු, රටබඩු, දූවබඩු, දෙව්දත්
5. මිහිදුම්, පින්බත්, වේපස්, දියබත් (.................)

1.9 කෘදන්තයක් නො වන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. ගැයුම්, වැයුම්, බැලුම්, රැගුම්
2. කරනු, කියනු, ලියනු, රකිනු
3. ලියන, කියන, බලන, දුවන
4. ඇඬිලි, කැවිලි, දෙඩිලි, නැටිලි
5. වැටූ, කෙටූ, ලියූ, බැලූ

1.10 පහත සඳහන් උද්ධෘතවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

අ) දොළ **ගැලුවොත්** හෙට උදේට - කොහොම ද ඉස්කෝලෙ යන්නෙ

ආ) පඩි පෙළින් **බැස** අයින් වී එන්න.

ඇ) ස්වර්ණතිලකා දෙසට ආවේ දනන් පාගා **මරා දමමින්**

ඈ) **කියනු මැන** සිදු වූයෙ කිම්ද මේ ඔබතුමට

1. අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා
2. මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
3. අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා
4. පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
5. විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා (.................)

The National e-learning Portal for The General Education

1.11 තද්ධිතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. ධීමත්, ඉසුරුමත්, රූමත්, සිරිමත්
2. පින්වත්, ගුණවත්, ධෛර්යවත්, ආශ්චර්යවත්
3. නෛපුණ්‍යය, තාරුණ්‍යය, ඖචිත්‍යය, සාකල්‍යය
4. සෙල්මුවා, දූවමුවා, පිනිමුවා, රන්මුවා
5. ගුණවන්ත, පින්වන්ත, කරුණාවන්ත, ඥානවන්ත (.................)

1.12 උපසර්ගයක් යෙදී **නොමැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.

1. දුර්ගුණ, දුසිරිත්, දුර්මත, දුර්වර්ණ
2. අනවශ්‍ය, අනාචාර, අනිෂ්ට, අනුක්ත
3. කුපෝෂණ, කුරිරු, කුමන්ත්‍රණ, කුකවි
4. සමීක්ෂණ, සමාරාධනාව, සමතික්‍රමණය, සමුපකාර
5. නුපුරුදු, නුපුහුණු, නුරුස්නා, නුදුරු (.................)

1.13 නිපාතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. මෙන්, සේ, වැනි බඳු
2. විසින්, කෙරෙන්, වෙරෙන්, කෙරෙහි
3. අනේ, අපෝ, අද්දෝමැයි, අයියෝ
4. ඉක්බිති, නිතොර, ඉතින්, යළි
5. ඇයි, කවර, කොයි, කුමක් (.................)

1.14 ''**සාහිත්‍යය** හා ශාසනික **අභිවර්ධනයට අත්‍යවශ්‍ය වූ** ප්‍රබල ගද්‍ය කාව්‍යයක් ලෙස සද්ධර්මරත්නාවලිය අගය කළ හැකි ය.'' යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද අඳු අකුරින් මුද්‍රිත පද අයත් වන්නේ කවර ව්‍යාකරණ අංගයකට ද?

1. තද්ධිත, සමාස, සන්ධි
2. සමාස, සන්ධි, තද්ධිත
3. සන්ධි, සමාස, තද්ධිත
4. තද්ධිත, සන්ධි, සමාස
5. සමාස, තද්ධිත, සන්ධි (.................)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියාරූප සහිත වරණය තෝරන්න.

1. ලියවුණේ ය, ඇසුණෝ ය, ගැයුණෝ ය, කියවුණේ ය
2. කකා, බිබී, ඇවිද, නට නටා
3. කිව්වෝ ය, දිව්වෝ ය, බැලුවේ ය, නැටුවෝ ය
4. කරමින්, දුවමින්, බලමින්, එද්දී
5. කා, ගොස්, සෝදා, ලියා (.................)

1.16 සමාස **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. සඳරැස්, තලතෙල්, වනමල්, සරාසඳ
2. සුපසන්, විශිෂ්ට, උපනගර, අනුරූ
3. සියපත්, රුවනාර, දසබල, දිනකර
4. රත්මල්, කහකුරුල්ලා, සිරමැදිරියා, ලොකුඅම්මා
5. දුකසැප, තුරුලිය, පොත්පත්, ගුණදොස් (.................)

1.17 එක ම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.

1. යනෙන, දිනිසුරු, අරුණලු, සුළැඟිල්ල
2. අතිනැද, උපනූපන්, ගුණැති, නිලඹර
3. දෑත, මුදළිඳු, සූර්යෝදය, මහෙසුරු
4. මියුගුණු, තුනුවග, සිවුරඟ, මුංබියලි
5. ලිග්ගල, වක්කඩ, පත්තිරු, දුප්පත් (.................)

1.18 ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** පදයක් සහිත වරණය තෝරන්න.

1. නැටුම්, ගැටුම්, වැයුම්, රැඟුම්
2. ලියද්දී, දුවද්දී, බලද්දී, වසිද්දී
3. විද්‍යාඥ, විශේෂඥ, විද්‍යාවේදී, දෛවඥ
4. ගිරාඅඹ, පුංචිඅම්මා, අමුරෙදි, නිල්මානෙල්
5. රූමත්, කුල්මත්, සිරිමත්, දිරිමත් (.................)

1.19 ව්‍යාකරණානුකූල ව **නිවැරදි වැකිය** තෝරන්න.

1. තරුණයෙක් තරුණියක හා පාරේ යයි.
2. දරුවන් දෙමාපියන්ට කීකරු වීම මැනවි
3. අපි උත්සාහ කළොත් කළ නොහැකි දෙයක් නැත.
4. වෛද්‍යවරියක් වන ඈ දක්ෂ නර්තන ශිල්පිනියක් ද වෙයි.
5. මිනිස්සු මේ තරම් බොරු කියන්නේ ඇයි ? (.................)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

1. දරුවෝ කෑමත් අරන් පාසල් යති.
2. ඇයි ? කලින් ආවේ
3. මා හොඳින් ඉන්නා බව අම්මා දනියි.
4. පයින් යන්නන් දකුණෙන් යා යුතුයි.
5. මගේ හැටි බොහෝ දෙනෙක් දනිති. (.................)

## II කොටස

මෙම කොටසින් 2,3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

(02) අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

භාෂාවේදීන්ගේ මතය අනුව අද ලෝකයේ භාවිත කෙරෙන භාෂා හාර දහසක් පමණ වේ. මේ භාෂාවන්ගෙන් සමහරක් භාෂා අතර සෑහෙන තරම් වෙනසක් දක්නට ලැබෙයි. එමෙන්ම සමහරක් භාෂා අතර යම් ප්‍රමාණයකට සමානකම් ද දක්නට ලැබෙයි. එවැනි සමානකම් රාශියක් පවතින විට තීරණය කළ හැක්කේ එකී භාෂාවන්ගේ ඥාතිත්වයක් දක්නට ලැබෙන බවයි. ඒ භාෂා ඥාතිත්වය සලකා භාෂා පවුල්වලට (වංශවලට) බෙදා දැක්වීමට වාග් විද්‍යාඥයෝ කැමැත්තක් දක්වති. ඒ අනුව සංස්කෘත, ග්‍රීක්, ලතින්, ස්පාඤ්ඤ, ජර්මන්, ඉංග්‍රීසි වැනි භාෂා ඉන්දු යුරෝපීය භාෂා පවුලට (වංශයට) අයත් භාෂාවන් හැටියට පෙන්වා දෙති. සිංහල භාෂාව ද ඇතුළත් වන්නේ ඉන්දු යුරෝපීය භාෂා පවුලටයි. මෙසේ ම තෙළිඟු කර්ණාට, මලයාලි, දෙමළ ආදි භාෂාවන්ගේ ඥාතිත්වය අනුව ද්‍රවිඩ භාෂා වංශයකට අයත් වන භාෂාවන් හැටියට හඳුන්වා දී තිබේ. අරාබි, හීබෲ භාෂා ඇතුළත් වන සෙමිටික් භාෂා පවුලක් ගැන ද කරුණු දක්වති. මෙවැනි භාෂා පවුල් විසිහයකට ඥාතිත්වය පෙන්නුම් කරන භාෂා විශාල සංඛ්‍යාවක් අද ලෝකයේ ව්‍යවහාර වන බව වාග්වේදීන්ගේ මතයයි.

i. භාෂාවේදීන්ගේ මතය අනුව අද ලෝකයේ භාවිත කෙරෙන භාෂා ගණන කොපමණ ද?

ii. එකම පවුලකට අයත් භාෂා ලෙස ගොනු කිරීමට යොදාගත් නිර්ණායකය කුමක් ද?

iii. භාෂා විශාල සංඛ්‍යාවකට ඥාතිත්වය දක්වන භාෂා පවුල් ගණන කීයද?

iv. ඉන්දු යුරෝපීය භාෂා පවුලට අයත් භාෂාවන් දක්වන්න.

v. සෙමිටික් භාෂා පවුලට අයත් භාෂාවන් මොනවාද?

vi. සිංහල භාෂාව සහ දෙමළ භාෂාව අයත් වන වංශ දෙක නම් කරන්න. (ලකුණු 12)

ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

දැනුම් ආර්ථිකයක සුවිශේෂ ලක්ෂණය වන්නේ අනෙකුත් ආර්ථික සම්පත්වලට වඩා දැනුම් හැකියාව සහ ප්‍රවීණත්වය යන දැනුම් සම්පත් තීරණාත්මක වීමයි. දැනුම් ආර්ථිකයේ ප්‍රාථමික සම්පත දැනුම වන අතර භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය යන නිෂ්පාදනයේ සාම්ප්‍රදායික සාධක අතුරුදහන් නොවන නමුත් ඒවා ද්විතීයික වේ. මෙහි දී දැනුම් ආර්ථිකයක් තුළ ඵලදායිතාවය හා ආර්ථික සංවර්ධනය උදෙසා දැනුමේ සමාග්‍රහණය, නිර්මාණය, ප්‍රචලිත වීම හා ඵලදායී භාවිතය සිදුවේ. එහි සමාග්‍රහණය යන්නෙන් අදහස් වන්නේ ජාතික මෙන්ම අන්තර්ජාතික වශයෙන් නිර්මාණය කරනු ලබන දැනුම ග්‍රහණය කර ගැනීමයි. නිර්මාණය යනු පර්යේෂණ මඟින් රටේ සමාජ ආර්ථික අවශ්‍යතාවලට අදාළ නව දැනුම නිෂ්පාදනය කිරීම ය. ප්‍රචලිත කිරීම යනු දැනුම් සමාජයක් නිර්මාණය කිරීමේ සන්දර්භයක් තුළ සමාජය දැනුවත් කරනු පිණිස නොවිධිමත් සහ අවිධිමත් අධ්‍යාපනය මාර්ගයෙන් එකී දැනුම සමාජය පුරා ව්‍යාප්ත කිරීමයි. මෙහි දී අධ්‍යාපනයේ සම අවස්ථා හා සාධාරණත්වයේ මූලධර්මය පදනම් කර ගනිමින් සියලු ජනතා කොට්ඨාසවල සහභාගීත්වය ඇති ව දැනුම ප්‍රජාතන්ත්‍රීකරණය වේ. භාවිතය යන්නෙන් අදහස් වන්නේ භාණ්ඩ සහ සේවා නිපැයුම උදෙසා පවත්නා දැනුම ප්‍රයෝජනයට ගැනීමයි. එය ව්‍යවසායකත්වය, නවෝත්පාදනය, පර්යේෂණ හා සංවර්ධනය පුද්ගල අධ්‍යාපනය, කුලසතා මට්ටම් යන සියල්ල ම අදාළ ය. (ලකුණු 15)

(03) දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළව වචන 300 - 350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

i. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යවලින් කෙරෙන වෙළඳ දැන්වීම් නිසා සමාජයට වන බලපෑම

ii. සමාජ ප්‍රගමනය උදෙසා තාක්ෂණවේදය විෂය ධාරාවේ වැදගත්කම

iii. නිරෝගී දිවියකට අත්‍යවශ්‍ය ව්‍යායාම

iv. මත්ද්‍රව්‍ය වෙළඳාම හා නූතන පරපුරෙහි අනාගතය

v. රටෙහි සංවර්ධනය සඳහා සංචාරක ව්‍යාපාරයෙහි බලපෑම

vi. වාණිජ ලෝකය තුළ වැඩි වන අපරාධ හා දූෂණ මර්දනය කිරීමට ගත හැකි පියවර (ලකුණු 25 යි)

(04) අ) පහත සඳහන් වාක්‍යවල **සදොස්** තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

i. තොටගමුවේ රහල් හිමි සන්දේශ කාව්‍ය දෙකක් ලියූහ.

ii. බස්රථ හා වෙනත් වාහන දහස් ගණනක් උදේ සවස කොළඹ නගරයට ඇතුළු වෙති.

iii. විශාඛා තොමෝ සන්සුන්ව ගමන් කරති.

iv. කාමරයක මිල අධික නිසා ඔවුන් එහි නවාතැන් ගැනීමේ අදහස අත් හරී.

v. දැන් දැන් සමහරෙක් නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනවශ්‍ය කොට සලකන්නා සේ පෙනේ.

ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

i. නූතන නාට්‍ය විචාරකයෝ ප්‍රේක්ෂකයන් දැනුවත් කරති.

ii. ඔවුහු ගුරුවරුන් හමු වී සිය අදහස් දැක්වූහ.

iii. අධිකරණ වෛද්‍යවරයා හඳුනා නොගත් පුද්ගලයාගේ මරණය අධික රුධිර වහනය නිසා සිදුවූවක් බව ප්‍රකාශ කළේ ය.

iv. විදුහල්පතිනිය අ.පො.ස උසස් පෙළ විභාගයෙන් දිවයිනේ ප්‍රථම ස්ථානය ලබාගත් ශිෂ්‍යාව සාදරයෙන් පිළිගත්තා ය.

v. අධ්‍යාපන ඇමතිතුමා විෂය ප්‍රතිඵල ඉහළ නැංවූ ගුරුවරුන් ඇගයීමට ලක් කළේ ය.

ඇ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

i. පඬිවරුන්ගේ මතය කුමක් වුවත් පුරාතන සිංහල (කවීන් /කවීහු) හැකි හැම විටම සංස්කෘත බලපෑමෙන් ඉවත්වන්නට බැලූහ.

ii. බොහෝ සිංහල ගීත ගායකයෝ (වාදකයෝ / වාදකයන්) වෙති.

iii. ''(ළමයි / ළමයින්) ගුරුවරුන්ට වෛර කරති යි'' මම නොසිතමි.

iv. (දරුවෝ / දරුවන්) යහ මග යවන්නේ කෙසේද?

v. සීගිරි චිත්‍ර පිළිබඳව නොයෙක් (උගත්තු / උගතුන්) විවිධාකාරයේ අදහස් පළ කොට ඇත.

(ලකුණු 5x3 = 15)

(05) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරින්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනුඅංගය දක්වන්න.

i. **දියනෙත උදාවත** සිය **කිරණින්** මහරු
(දියනෙත - සමාස, උදාවත - ක්‍රියා , කිරණින් - විභක්ති)

ii. **නැණැති දනන්හට** මඳ ගුණයක කළ **ද**
(නැණැති - සන්ධි, දනන්හට - විභක්ති ද - නිපාත)

iii. **නිති සුපසන්න** සරසවි රැඳි **මුවතඹර**
(**නිති** - නිපාත, **සුපසන්න** - සමාස, **මුවතඹර** - සමාස)

iv. මඩ **කඬිති** හැම තැන **ම** මඩ පාට දිය **රැඳුන**
(**කඬිති** - තද්ධිත, ම - නිපාත, රැඳුන - කෘදන්ත)

v. **ගැමි ජනයාට** ඉතා සරලවත් පහසුවෙනුත් **ධර්මෝපදේශ** ලබා දීම සඳහා සද්ධර්මරත්නාවලිය ලිය වී ඇත.
(**ගැමි** - තද්ධිත, **ජනයාට** - විභක්ති, **ධර්මෝපදේශ** - සන්ධි) (ලකුණු 5x3 = 15)

(06) අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(ප්‍රතිපදාව, ප්‍රපංච, සානුකම්පික, පරිකල්පන, ස්ථාවරත්වය, අත්‍යන්ත)

i. භාෂාවත් ව්‍යාකරණයත් අතර ඇත්තේ ................................... සම්බන්ධතාවයකි.

ii. දේශපාලන ................................ රටක සංවර්ධනය සඳහා බෙහෙවින් බලපාන සාධකයකි.

iii. මධ්‍යම .............................. නූතන සමාජයේ ගැටලු විසඳා ගැනීමට අදාළ කර ගත හැකි බව බොහෝ දෙනාගේ මතයයි.

iv. ජනකවියාගේ ................................. දෘෂ්ටිය එක් ජන කොටසකට පමණක් සීමාවූවක් නොවේ.

v. දරිද්‍රතාව හා විදේශීය සංක්‍රමණය නම් .............................. දෙක අන්‍යොන්‍ය වශයෙන් සම්බන්ධතාවක් දක්වයි.

vi. මිනිසාගේ ................................ ශක්තිය දියුණුවත් ම ඔවුහු වනයේ අනිත් සතුන් අබිබවා යන්නට වූහ.

(ලකුණු 1/2x6 = 03)

ආ) පහත දැක්වෙන පද සන්ධි කර ලියන්න.

| | | | |
|---|---|---|---|
| i. | බහු + අර්ථ | ii. | නි + බඳ |
| iii. | දඹු + කඩ | iv. | රත්මල් + ආන |
| v. | බුදු + සරණ | vi. | ඔබින් + ඔබ |

(ලකුණු 1/2 × 6 = 3 යි)

ඇ) තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

i. **ඇසේ** මතුවන කඳුළු බිඳු ගෙන - **ඔබේ** සිරිපා දොවන්නම්

ii. වී **පැදුරෙන්** ඉගිලී යන කුරුල්ලකු ලෙසින් - ඉගිළයන්න බෑ මට **සියුමැලියෙ** ඔබ ළඟින්

iii. මේ දරු දූරියන් නොදුටුව **දෑසින්** - එක **දරුවෙක්** තනි වී එනවා

(ලකුණු 1/2 × 6 = 3)

ඈ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත සඳහන් වාක්‍ය නැවත ලියන්න.

i. නැත උපාසකයෙනි සිඟුවත් නිරන්තරව ම මෙසේ ම දන් ලැබෙති යි තෙරුන්නාන්සේ කීහ

ii. නීතියක් වශයෙන් ප්‍රධාන කොට වනයෙහි පවතින්නේ බිය ය බඩගින්න හා පිපාසය ඊළඟට පැමිණේ 3 වෙනි පිට

iii. මානව වර්ගයාගේ අදහස් අදහස් ශිල්ප විධි චින්තනය හා චාරිත්‍ර චාරිත්‍ර යන සියල්ල අඩංගු සමස්තය සංස්කෘතිය නම් වෙයි.

(ලකුණු 1/2 × 6 = 03 යි)

ඉ) පහත දැක්වෙන ප්‍රකාශනවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

i. ''අපි ලබන සතියේ ශ්‍රමදානයක් කරමු'' යි සමිති සාමාජිකයෝ පැවසූහ.

ii. ''පොත පත පරිශීලනය කිරීම පුරුද්දක් කර ගන්නැයි'' සාහිත්‍ය උත්සවයට පැමිණි ලේඛකයා දරුවන්ගෙන් ඉල්ලා සිටියේ ය.

iii. ''හැම දෙමව්පියෝ ම දරුවන් දූඩි කරන්නෙ දුක් මහන්සි වෙලා'' යි විදුහල්පතිතුමා ප්‍රකාශ කළේ ය.

(ලකුණු 1 × 3 = 3)

(07) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සුවදායී **ජීවිතයක්** අපේක්ෂාවෙන් ස්වභාව ධර්මය **අභිභවනය** කොට මනුෂ්‍ය සංහතිය විසින් **නිර්මාණය** කර ගන්නා ලද **තාක්ෂණය** මිනිසා විසින් මිනිසාට ම එරෙහිව යෙදවීම විසිවන සියවසේ වඩාත් තදින් තහවුරු විය. න්‍යෂ්ටික අවි **නිෂ්පාදනය** සහ අධිරාජ්‍යවාදී ප්‍රචණ්ඩ යුද්ධ සැලසුම් ද මෙකල අන් සියල්ල අබිභවා ප්‍රමුඛත්වයට පැමිණ ඇත. සමස්ත මානව පැවැත් ම බේදවාචකයක් බවට පමුණුවාලන මේ තත්ත්වය කලාවේ විෂය ක්ෂේත්‍රය **පෘථුලත්වයට** පත්කිරීමට හේතු වී තිබේ. අප්‍රිකානු ඉන්දියානු, වියට්නාම් හා පලස්තීන සාහිත්‍ය කෘති මේ සඳහා මනා නිදසුන් සපයයි. මෙහි ම ප්‍රතිපක්ෂය ගතහොත් මානුෂික පැවැත්මෙහි ද, එහි ප්‍රතිඵලය වශයෙන් සාහිත්‍යයේ හා කලාවේ ද විනාශය සිදු කිරීමට ක්‍රියාත්මක වනු ඇත්තේ ද මේ **වෛෂයික** පදනම ම ය. **මානව** සංහතිය පෘථිවි තලයෙන් අතු ගා දමා දේශදේශාන්තරයන් තම තමන් අතර බෙදා හදා ගැනීමට ලොව මහ බලවතුන් සැලසුම් කරන යුද්ධෝපායයන්ගේ න්‍යෂ්ටිය ලෙස තාක්ෂණය ම ක්‍රියාත්මක වෙයි.

i. ඡේදයේ කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළට සකස් කර ලියන්න.

ii. නිර්මාණය, වෛෂයික, යුද්ධෝපායයන්ගේ යන වචනවල යෙදී ඇති පිළි වෙන වෙන ම ලියන්න.

iii. ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.

1. මූර්ධජ අක්ෂරයක් සමඟ යංශය යෙදුණු වචනයක්
2. අනුස්වාරය සහ අන්තර්ස්ථාක්ෂරයක් යෙදුණු වචනයක්
3. තාලුජ අක්ෂරයක් සහ දන්තජ අක්ෂරයක් යෙදුණු වචනයක්

iv. පහත සඳහන් පදයන්හි තද්ධිත ප්‍රත්‍ය දක්වන්න.
පෘථුලත්වය, ඉන්දියානු, වෛෂයික

v. පහත දැක්වෙන ක්‍රියා වර්ගවලට උදාහරණ වචනය බැගින් ඡේදයෙන් උපුටා ලියන්න.
පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා, කර්ම කාරක ක්‍රියා

(ලකුණු 3 × 5 =15යි)

(08) පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

i. පූර්ව ස්වර ලෝප සන්ධිය
ii. දකාරාර්ථ සමාසය
iii. ප්‍රයෝජ්‍ය ක්‍රියා පද
iv. අනියමාර්ථ නාම පද
v. මිශ්‍ර ක්‍රියා පද (ලකුණු 3 × 5 =15යි)

The National e-learning Portal for The General Education